(සියළුම හිමිකම් ඇවිරිණි)　　　　00004

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

## ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණය - 2013 (1)

(13) සිංහල (දෙවන භාෂාව)

Sinhala- (Second Language)

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
எல்லா வினாக்களுக்கும் விடை எழுதுக.

කාලය: පැය දෙකයි.
இரண்டு மணித்தியாலங்கள்

1. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 150 ක පමණ රචනයක් ලියන්න. සිංහල බසින් ලියන්න.

பின்வரும் தலைப்புகளுள் ஒன்றைத் தெரிவுசெய்து ஏறத்தாழ 150 சொற்களைக் கொண்ட கட்டுரையொன்றைச் எழுத்துச் சிங்கள மொழியில் எழுதுக.

අ. අපේ ගහකොළ
ආ. නගර සංවර්ධනය
ඇ. කෘෂිකර්මය නගා සිටුවීමට නම්....
ඈ. වැඩිහිටියන් අගයමු

(ලකුණු 16)

2. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
பின்வரும் பந்தியை வாசித்து அதன் கீழ் தரப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.

සටන් බිමට පිවිසි කීප දෙනෙකු අභිභවා එම වසරේ චිත්‍රපට පිළිබඳ වෙසෙස් පුද්ගලයාට හිමි සම්මාන ලාභය වන ජෝන් ද සිල්වා සමරු රිදී කුසලාන වැඩි ඡන්ද 1727 ක ජය ගැන්මකින් 1957 අගෝස්තු මස 13 වැනි දින ගරු අධ්‍යාපන ඇමති විජයානන්ද දහනායක මැතිතුමා අතින් ගරු මර්සලීනු ජයකොඩි පියතුමා දිනා ගත්තේය.

මෙම උළෙල ඉතා ප්‍රශංසනීය අන්දමින් ඇමතිතුමා සංවිධානය කර තිබුණේය. මුද්‍රිත ඇරයුම් පත් යවා මුළු දිවයිනේම ඉහළ නිලදරුවන් හා පරීක්ෂකවරුන්ද කැඳවා ඔවුනට ගරු පියනම හමුවන්නට සලසා තිබිණි. ගරු ජයකොඩි පියනම විසින් පබැඳි ගී තැටි කීපයක් විටින් විට විකාශනය කෙරුණි. ගරු පියනම සැපත් වත්ම එතුමාගේ 'ඔබයි අපේ රාණී' යන තැටිය හඬ නැගුණි. සියල්ලෝම ඔල්වර නද දී සිනා පිරි මුහුණෙන් එතුමන් පිළිගැනුණි. හඳුනාවුවෙන් හා කථනයෙන් අනතුරුව දහනායක ඇමතිතුමාණෝ තිළිණය ප්‍රදානය කළහ.

(මල්පැලක මිණිමුතු - ඔස්ටින් කැන්ටර්, 79 පිටුව)

අ. මෙහි සඳහන් කථා නායකයා කවුද?
ආ. එතුමා දිනාගත් සම්මානයේ නම කුමක්ද?
ඇ. මෙම උත්සවය සංවිධානය කරන ලද්දේ කවුරුන් විසින්ද?
ඈ. 'ඔබයි අපේ රාණී' යන තැටියේ තිබෙන ගී ලියුවේ කවුද?
ඉ. පහත සඳහන් වචනවල සරල තේරුම ලියන්න.

| | |
|---|---|
| i. අභිභවා | vi. නිලදරුවන් |
| ii. වෙසෙස් | vii. පබැඳි |
| iii. ලාභය | viii. සැපත් වත්ම |
| iv. ප්‍රශංසනීය | ix. ඔල්වර නද |
| v. මුද්‍රිත | x. තිළිණය |

(ලකුණු 15)

3. අ. පහත දැක්වෙන සිංහල යෙදුම්වලට ගැලපෙන දෙමළ/ඉංග්‍රීසි යෙදුම් ලියන්න.
பின்வரும் சிங்களப் பிரயோகங்களுக்குப் பொருத்தமான ஆங்கில/தமிழ் பிரயோகங்களை எழுதுக.

| | | | |
|---|---|---|---|
| i. | සමාජ සංවර්ධනය | ii. | අභියාචනය |
| iii. | අනුමත කිරීම | iv. | ජීවන වියදම |
| v. | මුඩු බිම් | vi. | සංඛ්‍යා ලේඛන |

ආ. පහත දැක්වෙන ඉංග්‍රීසි යෙදුම්වලට ගැලපෙන සිංහල යෙදුම් ලියන්න.
பின்வரும் ஆங்கிலப் பிரயோகங்களுக்குப் பொருத்தமான சிங்களப் சொற்களை எழுதுக.

| | | | |
|---|---|---|---|
| i. | Full name | ii. | email address |
| iii. | civil status | iv. | petition |
| v. | permit holder | vi. | investment |

(1 x 12 = ලකුණු 12)

4. පහත සඳහන් ඉංග්‍රීසි වාක්‍ය සිංහලට පෙරළන්න.
பின்வரும் ஆங்கில வாக்கியங்களை சிங்களத்தில் மொழிபெயர்க்க.

i. Language learning is complex.
ii. I fully agree with you.
iii. That is a very important role.
iv. Boards of Education may refer to the outcomes.
v. The following strategies might be helpfull.
vi. I have sat for 12 years in the Opposition at intervals.
vii. I can present clear, detailed descriptions on a wide range of subjects.
viii. The Council of Ministers of Education has also reviewed this document.
ix. So do not oppose for the sake of opposing
x. Anyway, what I am saying is that we have to accept that the private sector also has a role to play.

(2 x 10 = ලකුණු 20)

5. පහත සඳහන් වාක්‍ය අර්ථවත් වන ආකාරයට සුදුසු වචනවලින් හිස්තැන් පුරවන්න. ප්‍රශ්න අංකය හා ඔබ යෝජනා කරන වචනය පමණක් පිළිතුරු පත්‍රයේ සඳහන් කරන්න.
பின்வரும் வாக்கியங்கள் கருத்துள்ள வாக்கியங்களாக அமையும் விதத்தில் பொருத்தமான சொற்களைக் கொண்டு இடைவெளிகளை நிரப்புக.
விடைப்பத்திரத்தில் வினா இலக்கத்தையும் உமது விடையையும் மாத்திரம் எழுுக.

i ඒ ... එතුමා රිසි නොවීය.
ii. එතුමාගේ අණ ..... මම මෙය කෙළෙමි.
iii. නිදහස් දිනය සිහිකිරීම ....... එහි උත්සවයක් පැවැත්විණි.
iv. හොඳ සිරිත් තිබේ .... එහි ගැටුම් නොමැත.
v. මේ .... මම ඒ පිළිබඳව නොදත්තෙමි.
vi. අප පරිසරය රැකිය යුත්තේ පරිසරය අප රකින ...

(1 x 6 = ලකුණු 06)

6. පහත සඳහන් වාක්‍යවල හිස්තැන් සුදුසු වචනවලින් පුරවන්න. ප්‍රශ්න අංකය හා ඔබ යෝජනා කරන වචනය පමණක් පිළිතුරු පත්‍රයේ සඳහන් කරන්න.
பின்வரும் வாக்கியங்களில் உள்ள இடைவெளிகளைப் பொருத்தமான சொற்களைக் கொண்டு நிரப்புக. விடைப்பத்திரத்தில் வினா இலக்கத்தையும் உமது விடையையும் மாத்திரம் எழுதுக.

i. මම ශිෂ්‍යයෙක් .....
ii. ඔවුහු වහා එහි ......
iii. සමහරු බොරු ...
iv. අයෙක් නීති උල්ලංඝනය ....
v. මම මල්ලී සමඟ නගරයට ....
vi. අපරාධ දිනෙන් දින .....
vii. මේ කාර්යය කරන ලද්දේ ඔවුන් ....
viii. කවරයේ මේ දැන්වීම පළකළ ...

(1 x 8 = ලකුණු 08)

7. අ. පහත සඳහන් වචන ගලපා එක් පදයක් සේ ලියන්න.
பின்வரும் சொற்களைப் பொருத்தமான முறையில் இணைத்து தனிச்சொற்களாக எழுதுக.

| | | | |
|---|---|---|---|
| i. | ඔවුන් ඔවුන් | ii. | මංගල උත්සවය |
| iii. | දෙ අත | iv. | විදේශ ආධාර |
| v. | ජන ආනන්ද | | |

ආ. පහත සඳහන් වචන නිවැරැදි අක්ෂර වින්‍යාසය සහිතව නැවැත ලියන්න.
பின்வரும் சொற்களை சரியான எழுத்து முறைப்படி எழுதுக.

| | | | |
|---|---|---|---|
| i. | දීර්ග | ii. | අයිතිහාසික |
| iii. | ප්‍රථිඵල | iv. | ඖෂධ |
| v. | බියානක | viii. | දනාත්මක |

(1 x 13 = ලකුණු 13)

8. පහත සඳහන් වචනවලට ගැලපෙන සමානාර්ථ පද එක බැගින් ලියන්න.
பின்வரும் சொற்களுக்குப் பொருத்தமான ஒத்தகருத்துச் சொற்களை எழுதுக.

| | | | |
|---|---|---|---|
| i . | අකැප | ii. | ආධුනික |
| iii. | ඥානවන්ත | iv. | අයිතිය |
| v. | අමනොඥ | vi. | දුබල |
| vii. | කන්තෝරුව | viii. | ඝන |
| ix. | ආරංචිය | x. | ලැදි |

(1 x 10 = ලකුණු 10)

*******************